# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 17 දරන
# ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අප්‍රේල් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 අප්‍රේල් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 17 දරන ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1983 අප්‍රේල් මස 29 වන දින]

**එල්. ඩී.—ඕ. 31/82**

**ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙනයාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

එකී මණ්ඩලය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු එකී මණ්ඩලය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී මණ්ඩලය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 17 දරන ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන්, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන්පසුව "ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය" යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්විය යුතු අතර, සියලු අධිකරණවල දී එකී නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි ඒ මුද්‍රාව වෙනස් කිරීමේ සහ අලුත් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය සංස්ථාගත කිරීම.

3. මණ්ඩලයේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි වන්නේ ය:— පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා වෙත භාර කර ඇති ජනතාවගේ ආගමික උන්නතිය සහ ශුභ සිද්ධිය ප්‍රවර්ධනය කිරීමෙන් එකී රාජගුරු ප්‍රසාදීන් වහන්සේලාගේ දේවගැති ධුරයේ කටයුතු සාමූහිකව ඉටු කිරීම;

(ආ) ආගමේ යහපත සඳහා වූ කටයුතු වඩා ඵලදායි අන්දමින් දියුණු කිරීම;

(ඇ) පොදු යහපත සඳහා වූ කරුණුවල දී වෙනත් රාජගුරු මණ්ඩල සමඟ, විශේෂයෙන්ම අසල්වාසී රටවල පිහිටි රාජගුරු මණ්ඩල සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම;

ඒ 63848—8000 (82/06)

(ඈ) කතෝලික ලබ්ධියේ සහ කතෝලිකයන්ගේ අර්ථ සිද්ධිය ප්‍රවර්ධනය කිරීම, වැඩි දියුණු කිරීම සහ ආරක්ෂා කිරීම සහ කතෝලිකයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීම ; සහ

(ඉ) පුණ්‍ය කටයුතු සහ මානුෂික සංවර්ධන කටයුතු භාර ගැනීම.

සංස්ථාවේ රීති.

4. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද මණ්ඩල, කමිටු, කොමිෂන් සහ මධ්‍යස්ථාන පිහිටුවීම හා එකී මණ්ඩල, කමිටු, කොමිෂන් සහ මධ්‍යස්ථානවල ද සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කර ගෙන යාම සඳහා ද සංස්ථාවේ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සඳහා ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද රෝමානු කතෝලික සභාවේ නීතිවලට සහ ව්‍යවහාරවලට අනුකූලව ප්‍රඥාගෝචර යයි මණ්ඩලය විසින් සලකනු ලබන්නාවූත් මේ පනතට අනනුකූල නොවන්නාවූත් රීති සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන්, කලින් කල සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) එසේ සාදනු ලැබූ රීති, එවැනි රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් වෙනස් කිරීම, සංශෝධනය කිරීම, අවලංගු කිරීම හෝ ඒවාට අලුතින් එකතු කිරීම කරනු ලැබිය හැකිය.

සංස්ථාවේ රීතිවලට එකී සාමාජිකයන් යටත් විය යුතු බව.

5. සංස්ථාවේ සියලු සාමාජිකයෝ සියලු අවස්ථාවලදී ම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුත්තාහ.

දේපළ දැරීමට සංස්ථාව සතු බලය.

6. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් බුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන චංචල සහ නිශ්චල යම් දේපළක් භාර ගැනීමේ හා දැරීමේ හැකියාව හා ශක්තතාව නීතියෙන් සංස්ථාව සතු විය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නියෝජනය කිරීමේ පූර්ණ බලය සහිතව, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතුය.

දේපළ පැවරීම.

7. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ විට, මණ්ඩලයේ නාමයෙන් දරන ලද හෝ වෙනත් යම් තැනැත්තකුගේ නැතහොත් තැනැත්තන්ගේ නමින් මණ්ඩලය සඳහා භාරයක් වශයෙන් දරන ලද හෝ මණ්ඩලය විසින් පිහිටුවන ලද නැතහොත් පවත්වා ගෙන යනු ලබන යම් සෙමනේරියක, ආයතනයක නැතහොත් මධ්‍යස්ථානයක ප්‍රතිලාභය සඳහා දරන ලද මණ්ඩලය සතු චංචල හා නිශ්චල සියලු දේපළ සංස්ථාව වෙත පැවරෙන අතර ඒ දේපළ සංස්ථාව වෙත මෙයින් පවරා දෙනු ලැබේ. තවද ඒ දේපළ සහ මින් මතු අත් කර ගනු ලබන චංචල හා නිශ්චල සියලු දේපළ සහ සංස්ථාව වෙත ලැබෙන හෝ ලැබීමට ඇති සියලු දායක මුදල්,

පරිත්‍යාග, ණය හා අනෙකුත් සියලු මුදල්, එකී සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීති වලට යටත් ව, දැරිය යුතුය.

(2) ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය සංස්ථාගත කිරීම හේතු කොට ගෙන ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලයේ පාලනයට යටත් වන සියලු චංචල හා නිශ්චල දේපළ සම්බන්ධ යෙන් ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලයේ නාමට, කොළඹ අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ ගාල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ මහනුවර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ යාපනයේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ මන්නාරමේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ ත්‍රිකුණා මලය-මඩකලපුව රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ හලාවත රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ අනුරාධපුර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ බදුල්ල රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් හෝ ලියා අත්සන් කරනු ලබන පැවරීමේ, විකිණීමේ හෝ සතුකර දීමේ කවර වුවද සාධන පත්‍රයක්, මුද්දර ආඥාපනතේ "අ" උප ලේඛනයේ I වන කොටසේ 23 (7) වන විෂයය යටතේ මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

8. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතුව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් සහ පරිත්‍යාග ලබා ගැනීම හා එකතු කිරීම, මණ්ඩලයේ අරමුදල් ආයෝජනය කිරීම සහ මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම් සඳහා අවශ්‍ය සේවක පිරිස බඳවා ගැනීම, ඔවුන් සේවයේ නියුක්ත කිරීම සහ ඔවුන් සේවයෙන් නෙරපීම ඇතුළුව, සංස්ථාවේ අරමුණු හා පරමාර්ථ සියල්ලම හෝ ඉන් යම් අරමුණක් හෝ පරමාර්ථයක් හෝ උන්නතියට පත් කිරීම නැතහොත් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේවල් සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාවේ සාමාන්‍ය බලතල.

9. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසි කම්වලට හැර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවිය යුතුය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. [illegible] (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී [illegible] සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව [illegible] වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.